පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date 2025.08.28 පැය 0820 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/1657/2025 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk

**කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය අසල පැවැති විරෝධතාවයකදී පොලිස් නිලධාරියෙකුට තුවාල සිදුකිරීම සම්බන්ධයෙන් සැකකරු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2025.08.26 වන දින කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය අසල පැවති විරෝධතාවයක් අතරතුරදී එහි රාජකාරි යෙදී සිටි පොලිස් නිලධාරියෙකු හට බෝතලයකින් පහරදී තුවාල සිදුකිරීම හා පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීමේ සිදුවීමට අදාල සැකකරු කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කළුතර නගරයේදී 2025.08.27 වන දින අත්අඩංගුවට ගෙන කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 52 ක් වන නාගොඩ, කළුතර ප්‍රදේශයේ පදිංචි හිටපු නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකු වේ.**

සැකකරු 2025.08.28 වන දින කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. කොම්පඤ්ඤවීදිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**